පෙබරවාරි 2026

# ගෞරවාන්විත සුරැකුම් පද්ධති සඳහා විශ්වීය සමාජ ආරක්ෂණය සඳහා ආයෝජනය




## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාව මෑතකාලීනව අර්බුද ගණනාවකට මුහුණ දී ඇත. ආර්ථික බිඳවැටීම, දේශගුණික කම්පන සහ මූල්‍ය ඒකාබද්ධකරණය යනාදිය රටේ සමාජ ආරක්ෂණ පද්ධතිවල ගැඹුරු ව්‍යුහාත්මක ගැටළු නිරාවණය කර ඇත. අස්වැසුම වැනි යෝජනා ක්‍රම මෙම බහුමාන කම්පන වලින් කම්කරු පාන්තික සහ අඩු ආදායම්ලාභී පවුල් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පැහැදිලිය. කොළඹ වැනි නාගරික ප්‍රදේශ තුළ මෙකී සංකීර්ණ අර්බුධ අවිධිමත් ආර්ථිකයේ නියැලෙන මෙම ප්‍රජාවන්ගේ ආදායම් අහිමි වීම, ආහාර අනාරක්ෂිතතාව, සහ අධික ණය බර යනාදියට හේතු වී ඇත.

මෙම බලපෑම් දැඩි ලෙස සමාජභාවය මත පදනම් වී ඇති අතර, කාන්තාවන්, විශේෂයෙන් වැඩ කරන මව්වරුන්, එහි වැඩිම බර දරයි. තම පවුල්වල සහ නිවෙස්වල එදිනෙදා කටයුතුවලින් වැඩි කොටසක් සම්පූර්ණ කරන්නේ කාන්තාවන්ය. සියල්ලට පෙර ආහාර වේල් මඟහරින්නේ ද, විදුලිය ඉතිරි කර ගැනීම සඳහා කාලය ඉතිරි කරන විදුලි උපාංග භාවිතා නොකර සිටින්නේ ද, එදිනෙදා වියදම් සම්පූර්ණ කිරීම සඳහා අමතර රැකියාවලට නැඹුරු වන්නේ ද කාන්තාවන්ය.

ඉතා පටු ලෙස ඉලක්කගත කර ඇති මුදල් හුවමාරු වැඩසටහන් කෙටි කාලීන සහනයක් පමණක් ලබා දෙයි. මේවා මගින් අවිධිමත් අංශයේ රැකියාවලින්, සමාජභාවය මත පදනම්ව සුරැකුම් රාජකාරිවලින්, ආබාධිතභාවයෙන්, මහළුවියෙන්, නිවාස අයිතියෙන් සහ දේශගුණික අවදානම්වලට නිරාවරණය වීමෙන් හැඩගස්වෙන ව්‍යුහාත්මකව අවදානමට ලක්වීමට ඇති ප්‍රවණතා සහ අසමානතා අවධාරණය කිරීමක් හෝ ආමන්ත්‍රණය කිරීමක් සිදු නොවේ.

සමාජ ආරක්ෂණය පරිවර්තනීය විය යුතුය. එක සමාජ සාධාරණත්වය සහ සියළු පුද්ගලයින්ගේ සහ ප්‍රජාවන්ගේ ගෞරවය කේන්ද්‍ර කර ගත යුතුය. අවදානමට ලක් විය හැකිබව හුදෙක් ගතික සහ ජීවන චක්‍රය මත පදනම් වූවක් බව අවධාරණය කරමින්, විශ්වීය සමාජ ආරක්ෂණය මගින් ඉල්ලා සිටින්නේ විශ්වීය සේවා සඳහා පොදු ආයෝජනයයි. ආදායම් ආරක්ෂිතතාවය සහ මූලික සේවාවන් සඳහා තිබෙන ප්‍රවේශය සහතික කරමින්, විශ්වීය සමාජ ආරක්ෂණය කැළඹීම්වලට පෙර, පසු සහ කැළඹීම් අතරතුර ආරක්ෂාව සහතික කරයි.

> “වතුර බිල්, කරන්ට් බිල් හරි ඉහළයි. ඒවා ගෙවාගත්තම මුළු අස්වැසුම ගාණම ඉවරයි.” - කුසුමා*

*සියලුම නම් නිර්නාමික කර ඇත.

COLOMBO URBAN LAB

unicef for every child

## ප්‍රධාන සොයා ගැනීම්

ආර්ථික අර්බුදය අතරතුර සහ ඉන්පසුව කොළඹ තුළ කරන ලද අපගේ පර්යේෂණවලින් හෙළිදරව් වූයේ ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන බිම් මට්ටමේ පවතින යථාර්ථය නිරූපණය නොකරන බවයි. අර්බුදයේ බලපෑම කම්කරු පන්තියේ ජනතාවට තවමත් දැඩි ලෙස දැනේ. දිත්වා සුළිකුණාටුවෙන් පසු මෙය තවත් උග්‍ර වී ඇත.

බලපෑම ස්ථරගත වේ; සමාජභාවය මත පදනම් වේ; සුරැකුම් වගකීම්වලට බැඳී තිබේ. සංක්‍රමණය සහ නැවත ස්ථානගත කිරීම් හේතුවෙන් සාම්ප්‍රදායික සුරැකුම් ජාල අඩපණ වී ඇත. සුරැකුම සඳහා පවතින යටිතළ පහසුකම් ප්‍රමාණවත් නොවන අතර, ඒවා වැඩිහිටි දරුවන්ගේ, ආබාධ සහිත දරුවන්ගේ, මහළු පුරවැසියන්ගේ සහ සුරැකුම් සපයන්නන්ගේ සුරැකුම පිළිබඳ සැලකිලිමත් වන්නේ කලාතුරකිනි. වැටුප් ලබන ශ්‍රමය සහ සුරැකුම් රාජකාරි යන දෙකම සම්පූර්ණ කරන කාන්තාවන් දැඩි කාල දරිද්‍ර තත්ත්වයකට මුහුණ දෙති.

කම්කරු පාන්තික කාන්තාවන් බොහෝ විට නිරත වන්නේ විළිමහනේ වෙළඳාම් කිරීම සහ ගෘහස්ථ සේවය වැනි, ස්ථිර ආදායමක් සහ ශ්‍රම ආරක්ෂණ රහිත, අවිධිමත් අංශයේ රැකියාවලය. සුරැකුම් රාජකාරි, කාලගුණික කැළඹීම් සහ ලෙඩරෝග යන සියල්ල ආර්ථික අවිනිශ්චිතතාවයට සහ ආහාර අනාරක්ෂිතභාවයට හේතු වේ. මෙම කිසිවක් සාම්ප්‍රදායික සමාජ ආරක්ෂණ පද්ධතිවලින් අවධාරණය නොවේ.

අස්වැසුම වැනි වැඩසටහන් මගින් සියළුම නිවාස ආවරණය නොවන බැවින්, එමගින් පවුල්වලට අර්ථවත් ලෙස සහයෝගයක් නොලැබේ. ආහාර, ඖෂධ මිලදී ගැනීමට සහ විදුලිය, ජලය යනාදිය සඳහා ගෙවීමට පවුල්වලට ඉහළ පොලී අනුපාත යටතේ අවිධිමත් ක්‍රම හරහා මුදල් ණයට ගැනීමට සිදුවී ඇත.

පවුල් දේශගුණික කම්පන වලින් ද ආරක්ෂිත නැත. සමාජ ආරක්ෂාවක් නොමැතිකම හේතුවෙන් නගරයේ සේවකයින් කාලගුණය නොතකා වැඩ කරන අතර ඔවුන් තමන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්ම අවදානමට ලක් කර ගනියි. අසනීප තත්ත්වයන්, වෙහෙස සහ ආදායම් අහිමි වීම යන සියල්ල කාන්තාවන් මත තිබෙන සුරැකුම් බර වැඩි කර ඔවුන්ගේ කාල දරිද්‍රතාවය උග්‍ර කරයි.

## නිර්දේශ

දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ළදරු සුරැකුම් මධ්‍යස්ථාන සහ පාසල් කාලයෙන් පසු වැඩසටහන් වැනි ප්‍රජා කේන්ද්‍රීය නාගරික යටිතල පහසුකම් පුළුල් කර ඒවාට ප්‍රමාණවත් සම්පත් සපයා දිය යුතුය. මෙම පහසුකම් ආරක්ෂිත, දැරිය හැකි මිලකට, සුදුසු යටිතල පහසුකම් සහිත විය යුතු අතර නියාමන ආයතනයක් විසින් නිරීක්ෂණය කර අධීක්ෂණය කළ යුතුය.

සියළුම වයස්වල දරුවන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා පාසල් ආහාර වැඩසටහන් ප්‍රාථමික පාසලෙන් ඔබ්බට යා යුතුය. ඒවා කාන්තාවන්ගේ කාල දරිද්‍රතාවය අඩු කරන අතර දරුවන්ගේ පාසල් කාලයට අනුකූල වන ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථා කාන්තාවන්ට ලබා දෙති. තවද, මෙම වැඩසටහන් පාසල් පැමිණීම වැඩි දියුණු කරන අතර ගෘහයක මූල්‍යමය බර ද අඩු කරයි.

විධිමත් අංශයේ සේවකයින්ට ලැබෙන අයිතිවාසිකම් සහ ආරක්ෂණ, එනම් අවම වැටුප්, අනිවාර්ය වැටුප් සහිත නිවාඩු, මාතෘ ප්‍රතිලාභ, කොන්ත්‍රාත්තු සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් කිරීම යනාදී අයිතිවාසිකම් සහ ආරක්ෂණ අවිධිමත් අංශයේ සේවකයින්ට ලබා දීම සඳහා නීතිමය සුරක්ෂිතතාවන් හඳුන්වා දිය යුතුය.

ඉහළ යන උෂ්ණත්වයේ බලපෑමෙන් එළිමහන් සේවකයින් ආරක්ෂා කිරීම සඳහා දේශගුණය හා බැඳුණු සුරක්ෂිතතා අවශ්‍ය වේ. මෙය සෙවන, පොදු කරාම, වැසිකිළි සහ දියුණු විකුණුම් පහසුකම් වැනි පොදු යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමක් ලෙස විද්‍යාමාන විය හැකිය.

විශ්වීය සමාජ ආරක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ කරන ලද දත්ත පද්ධති අවශ්‍ය වේ. කැළඹීම අවස්ථා තුළ ප්‍රතිචාර, ඉන්පසුව සිදුවන නැවත ගොඩනැඟීම සහ සහයෝගය, සියළු දෙනා ඇතුළත් කරගන්නා, යථාර්ථය මත පදනම් වන බව සහතික කිරීම සඳහා පවුල්වල ආදායම, සුරැකුම් වගකීම්, ආබාධිතභාවය, සෞඛ්‍යය, නිවාස අයිතිය සහ දේශගුණික විපත් සඳහා නිරාවරණය පිළිබඳ දත්ත නිතිපතා රැස් කර යාවත්කාලීන කළ යුතුය.

ශ්‍රී ලංකාව සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රමයෙන් ශක්තිමත් කළ යුතු අතර, යළි ගොඩනැඟීම ප්‍රජාවන්ට තම ජීවිතය ගැට ගසා ගැනීමේ හැකියාව ලබා දීමෙන් ඔබ්බට යන බව සහතික කළ යුතුය. පරිවර්තනීය සමාජ ආරක්ෂණය හරහා ජනතාවට තම ජීවිත කාලය තුළ වඩා හොඳ ජීවන තත්ත්වයක් අත්විඳිය හැකිය.

@colombourbanlab
csf-asia.org/colombo-urban-lab